**සැ. යු. -** (i) 2016.12.23 වැනි දින පළ වූ අංක 1999 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2017 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික් අධිකරණ කලාපයට අයත් ජූරිසභිකයින්ගේ නාමාවලියක් සිංහල භාෂාවෙන් පමණක් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2000 - 2016 දෙසැම්බර් මස 30 වැනි සිකුරාදා - 2016.12.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1478 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 1482 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1483 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1484 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ජනවාරි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජනවාරි මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1477 – B 081129 —403 (2016/12)

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 1483

MOD/DEF/03/02/RET/239.

## ශ්‍රී ලංකා නාවික හමුදාව

### නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2016 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සිට නිත්‍ය නාවික උප සේවයට මාරුකිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමදෝරු (නීති) අමරපති මුදියන්සේලාගේ ආනන්ද වෛද්‍යරත්න වීරසිංහ, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්ඒ 0833

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

12 - 1171/1

---

2016 අංක 1484

MOD/DEF/03/02/RET/239.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2016 දෙසැම්බර් මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

කොමදෝරු (නීති) අමරපති මුදියන්සේලාගේ ආනන්ද වෛද්‍යරත්න වීරසිංහ, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්ඒ 0833

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

12 - 1171/2

---

2016 අංක 1485

MOD/DEF/10/03/RET/47.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2013 ජුනි මස 18 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්වා 2013 ජුනි මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදා නිත්‍ය උපසේවයට බඳවා ගන්නවා ඇත.

එයාර් වයිස් මාර්ෂල් බාලසූරිය ලේකම්ලාගේ වසන්ත බාලසූරිය (01320) - කාර්මික ඉංජිනේරු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

12 - 1206

---

2016 අංක 1486

MOD/DEF/10/03/PRO/05.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දිනයේ සිට ස්ථිර එයාර් වයිස් මාර්ෂල් නිලයට උසස් කෙරේ.

තාවකාලික එයාර් වයිස් මාර්ෂල් දබරේ ලියනගේ සුමංගල ඩයස් (01449) නි.පො.රා. 2015.08.15

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බී එම් යූ ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

12 - 1168

2016 අංක 1487

MOD/DEF/10/03/RET/122.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2015 අගෝස්තු මස 04 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්වා ඇත.

එයාර් කොමඩෝර් තිත්තගල්ල ගමගේ ජයසිරි අමරසේන (01481) විද්‍යුත් ඉංජිනේරු ශඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බී එම් යූ ඩී. බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 18 වැනි දින,
කොළඹ දී ය.

12 - 1205

---

2016 අංක 1488

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2013 මාර්තු මස 01 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

ගෲප් කැප්ටන් උපුල සේනක ලියනසූරිය (01705) - කාර්මික ඉංජිනේරු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

12 - 1207

---

2016 අංක 1489

MOD/DEF/10/03/RET/118.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2015 සැප්තැම්බර් මස 11 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්වා ඇත.

ගෲප් කැප්ටන් - පැටබැඳිගේ ලංකාධීර් ජයරෝහන් කොඩිප්පිලි (01439) - පරිපාලන රෙජිමේන්තු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

12 - 1199

---

2016 අංක 1490

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2012 දෙසැම්බර් මස 15 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

විං කමාන්ඩර් පාකිර් මොහිදීන් සෙයිද් අබ්දුල් රහීම් ජවුෆර් සාදික් (01712) - පාලන රෙජිමේන්තු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

12 - 1201

2016 අංක 1491

MOD/DEF/10/03/RET/43.

**ශ්‍රී ලංකා ගුවන් හමුදව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2013 පෙබරවාරි මස 10 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

විං කමාන්ඩර් බැස්ටියන් ආරච්චිගේ රවින්ද්‍ර ජයසිංහ (01869) - පරිපාලන රෙජිමේන්තු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

12 - 1209

---

2016 අංක 1492

**ශ්‍රී ලංකා ගුවන් හමුදව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2013 දෙසැම්බර් මස 31 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදවෙන් විශ්‍රාම ගන්වා ඇත.

විං කමාන්ඩර් පුරන්දර සරද මාවිටගම (01825) - කාර්මික ඉංජිනේරු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

12 - 1208

---

2016 අංක 1493

MOD/DEF/10/03/RET/76.

**ශ්‍රී ලංකා ගුවන් හමුදව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2014 මැයි මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදවෙන් විශ්‍රාම ගන්වා ඇත.

විං කමාන්ඩර් ඉදිරිසිංහ මුදියන්සේලාගේ යසනාත් අනුරුද්ධ බණ්ඩාර (01850) - නියමු පොදු රාජකාරි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

12 - 1202

---

2016 අංක 1494

MOD/DEF/10/03/RET/95.

**ශ්‍රී ලංකා ගුවන් හමුදව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2014 අගෝස්තු මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදවෙන් විශ්‍රාම ගන්වා ඇත.

විං කමාන්ඩර් - පාගොඩ මුදියන්සේලාගේ සුධර්ම මහින්ද පාගොඩ (01774) - පරිපාලන රෙජිමේන්තු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජුනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

12 - 1170

2016 අංක 1495

MOD/DEF/10/03/RET/117.

ශ්‍රී ලංකා ගුවන් හමුදව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2015 ජුනි මස 20 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් ස්වේච්ඡා නිලධාරියා ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදවෙන් විශ්‍රාම ගන්වා ඇත.

විංග් කමාන්ඩර් - කිරිහෙන්නදිගේ රෝහණ ජයලත් (වී/0252) - වෛද්‍ය ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බී එම් යූ ඩී. බස්නායක,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

12 - 1093

---

2016 අංක 1496

MOD/DEF/10/03/RET/60.

ශ්‍රී ලංකා ගුවන් හමුදව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2013 දෙසැම්බර් මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරිණිය ශ්‍රී ලංකා ගුවන් හමුදවෙන් විශ්‍රාම ගන්වා ඇත.

ස්කොඩ්රන් ලීඩර් කංකානම් ගමගේ ජයන්ති චන්දිමා ගමගේ (ඕ ඩබ්ලිව්/01054) - කාර්මික ඉංජිනේරු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

12 - 1092

2016 අංක 1497

ශ්‍රී ලංකා ගුවන් හමුදව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2013 දෙසැම්බර් මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරිණිය ශ්‍රී ලංකා ගුවන් හමුදවෙන් විශ්‍රාම ගන්වා ඇත.

ස්කොඩ්රන් ලීඩර් විතාන ආරච්චිගේ රසිකා ලසන්ති ජයසුන්දර (ඕ ඩබ්ලිව්/01056 - කාර්මික ඉංජිනේරු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

12 - 1203

---

2016 අංක 1498

MOD/DEF/10/03/RET/116.

ශ්‍රී ලංකා ගුවන් හමුදව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2015 අගෝස්තු මස 06 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරිණිය ශ්‍රී ලංකා ගුවන් හමුදවෙන් විශ්‍රාම ගන්වා ඇත.

ස්කොඩ්රන් ලීඩර් ජයේශි අනුරාධා ගුණරත්න (ඕ ඩබ්ලිව්/01075 - පරිපාලන ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

12 - 1200

2016 අංක 1499

MOD/DEF/10/03/RET/123.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

**අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

2015 සැප්තැම්බර් මස 30 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් රත්නායක මුදියන්සේලාගේ සංජීව රත්නායක (02725) - පරිපාලන රෙජිමේන්තු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජුනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

12 - 1204

2016 අංක 1500

MOD/DEF/10/03/RET/124.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

**අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

2015 නොවැම්බර් මස 16 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ඉළුඹේතැන්නේ ගෙදර රවීන්ද්‍ර - (02727) - පරිපාලන රෙජිමේන්තු ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජුනි මස 17 වැනි දින,
කොළඹ දී ය.

12 - 1169

## වෙනත් පත්කිරීම් ආදිය

2016 අංක 1501

### අධිකරණ අමාත්‍යාංශය

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 (3) වැනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම පහත උපලේඛනයේ සඳහන් නීතිඥ මහත්ම මහත්මීන් අදාළ අධිකරණ කොට්ඨාස සඳහා සමාදාන විනිශ්චයකාරවරුන් සහ නිලනොලත් මහෙස්ත්‍රාත්වරුන් වශයෙන් පත් කරමි.

| *අනු. අංකය* | *නම* | *ලිපිනය* | *අධිකරණ කොට්ඨාසය* |
|---|---|---|---|
| 1. | නීතිඥ චමින්ද විශ්වනාත් ජයසිංහ අරඹෙවෙල මහතා | අංක 261ඒ. වැක්වැල්ල පාර, ගාල්ල | ගාල්ල |
| 2. | නීතිඥ ගාර්දියේ වැලිගමගේ දර්ශන නිලාන් ප්‍රසන්න ද සිල්වා මහතා | අංක 299, "සිල්වා නිවස", කතළුව, අහංගම | ගාල්ල |
| 3. | නීතිඥ පීටර් ඇන්ඩෲ නෙවිල් මිරැන්ඩා මහතා | අංක 123/1, කෙසෙල්වතුගොඩ, යක්කල | ගම්පහ |
| 4. | නීතිඥ ඊරියගහඇලේ ජයමංගල ගෙදර ස්වර්ණා කුමාරි දමයන්ති ගුණතිලක මහත්මිය | අංක 296/ඒ/3, ඉහළයාගොඩ, ඉඹුල්ගොඩ | ගම්පහ |
| 5. | නීතිඥ රතුගේ ඥාණරත්න මහතා | අංක 57/1, ගැඩුමාන, හේනෙගම (බ.ප.) | ගම්පහ |
| 6. | නීතිඥ ජනිත්‍රි ජානකී වඩුගේ මහත්මිය | අංක 66/20, සුහද මාවත, වලව්වත්ත, වෑකඩ, පානදුර | පානදුර |
| 7. | නීතිඥ බෝලගේ හේරත් මුදියන්සේලාගේ සමිතා කුමාරි සෙනරත් බණ්ඩාර මහත්මිය | අංක 28, වෙද මාවත, ගොරකාන, කෙසෙල්වත්ත, පානදුර | පානදුර |
| 8. | නීතිඥ අගම්පොඩි සුසන්ත මෙන්ඩිස් ගුණසේකර මහතා | අංක 280/82, "ගාර්ඩන් සිටි", 3 වන පටුමග, ගාලු පාර, ලක්ෂපතිය, මොරටුව | කොළඹ |

| අනු. අංකය | නම | ලිපිනය | අධිකරණ කොට්ඨාසය |
|---|---|---|---|
| 9. | නීතිඥ රන්නුලු චම්පා ද සොයිසා මහත්මිය | අංක 48, හේන පාර, ගල්කිස්ස | ගල්කිස්ස |
| 10. | නීතිඥ වේවැල්වල හේවගේ සුනිල් ඥනතිලක මහතා | "සුගතසිරි", හව්පේ, ගාල්ල | ගාල්ල |
| 11. | නීතිඥ විතානගේ සනත් ධම්මික ගුණතිලක මහතා | "ඉදුවර", ගොනගලපුර, බෙන්තොට | බලපිටිය |
| 12. | නීතිඥ කොඩිතුවක්කු කංකානම්ගේ සංජය කොඩිතුවක්කු මහතා | අංක 738, ගාලු පාර, රන්දෙඹේ, අම්බලන්ගොඩ | බලපිටිය |
| 13. | නීතිඥ බුලත්වෙලගේ වියුඩර් ප්‍රනාන්දු මහතා | අංක 169B, දළුපොත, මීගමුව | මීගමුව |

විජයදස රාජපක්ෂ,
අධිකරණ අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12 - 1097

---

## රජයේ නිවේදන

යොමුව : ED/05/69/01/01/101.

### 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය

මීග/උදම්මිට රෝමානු කතෝලික බාලිකා විද්‍යාලය

අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් වන මම 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරික විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරි ඇති බලතල ප්‍රකාර, ක්‍රියා කරමින් අංක 13,594 හා 1963.04.06 දිනැති ලංකාණ්ඩුවේ (අති විශෙෂ) ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 2492 දරන පැවරුම් නියෝගයේ විස්තර කොට දක්වා ඇති පර්චස් 32ක භූමි ප්‍රමාණයට පමණක් අදළ වන තාක් දුරට 2016 දෙසැම්බර් මස 09 වැනි දින බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

2016ක් වූ දෙසැම්බර් මස 09 වැනි දින,
"ඉසුරුපාය",
පැලවත්ත, බත්තරමුල්ල.

12 - 1214

---

යොමුව : ED/05/69/01/01/123.

### 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය

බප/කැළ/වත්තල රෝමානු කතෝලික දෙමළ මිශ්‍ර විද්‍යාලය

අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් වන මම 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරික විධිවිධාන) පනතේ 10 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරි ඇති බලතල ප්‍රකාර, ක්‍රියා කරමින් අංක 13,319 හා 1962.10.01 දිනැති ලංකාණ්ඩුවේ

(අති විශෙෂ) ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1948 දරන පැවරුම් නියෝගයේ විස්තර කොට දක්වා ඇති රූඞ් 01යි පර්චස් 20ක භූමි ප්‍රමාණයට පමණක් අදාළ වන තාක් දුරට 2016 දෙසැම්බර් මස 09 වැනි දින බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

අකිල විරාජ් කාරියවසම්,
අධ්‍යාපන අමාත්‍ය.

2016ක් වූ දෙසැම්බර් මස 09 වැනි දින,
"ඉසුරුපාය",
පැලවත්ත, බත්තරමුල්ල.

12 - 1215

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

බෝදහන්දි ලොයිඩ් ජිනරන්ජන් ද සිල්වා

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.11.28 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් එම්.ඩී.පී.එස්. කරුණානායක විසින් සහතික කරන ලද අංක 4200 සහ 2011.08.26 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ හා පරිශ්‍රය බන්ධනදායි/උකස්කරු වශයෙන් ක්‍රියාකරමින් එකී බෝදහන්දි ලොයිඩ් ජිනරන්ජන් ද සිල්වා යන අය විසින් ලබාගත් මූලය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී බෝදහන්දි ලොයිඩ් ජිනරන්ජන් ද සිල්වා යන අය විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස්කොට ඇපයට තබා ඇති බැවින්ද, එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත අයවිය යුතු ගෙවීම් එකී ණය ගැණුම්කරු විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

ඒ අනුව රුපියල් පනස් නව ලක්ෂ හැත්තෑඅට දහස් හයසිය අනූනවයකුත් ශත හතලිස්එකක (රු.5,978,699.41) මුදල සහ 2016. 09.07 වැනි දිනට වාර ණය පහසුකම් මත හිඟ මුල් මුදල වන රුපියල් පනස්තුන් ලක්ෂ දෙදහස් හාරසිය අසූනවයකුත් ශත හැටදෙකක (රු.5,302,489.62) මුදල මත 2016.09.08 වැනි දින සිට තවදුරටත් පොළියද, තව ද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩු කොට, අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාව තුළ, බොරැල්ලේ පිහිටි පාර පුළුල් කිරීමට පසුව, බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1757 සහ 1985.02.09 වැනි දින දරන පිඹුර ප්‍රකාර, බෙදා වෙන් කළ කැබලි අංක A2 දරන බිම් කොටසේ නැවත මැන බෙදීමක් වන, වර්තමානයේ ආචාර්ය එන්.එම්.පෙරේරා මාවතේ (කලින් කොටා පාරේ) වරිපනම් අංක 60A දරන, බලයලත් මිනින්දෝරු එස්.වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 5080/9000 සහ 2008.08.19 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් ළ කැබලි අංක A2A දරන බිම් කොටසට මායිම්, උතුරට : ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත (කලින් කොටා පාර) ද; නැගෙනහිරට : ආචාර්ය එන්.එම්.පෙරේරා මාවතේ වරිපනම් අංක 62A දරන පරිශ්‍රය ද; දකුණට :ආචාර්ය එන්.එම්.පෙරේරා මාවතේ වරිපනම් අංක 60/1 දරන පරිශ්‍රය ද; බස්නාහිරට: ආචාර්ය එන්.එම්.පෙරේරා මාවතේ වරිපනම් අංක 60 දරන පරිශ්‍රය ද; යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 5080/9000 දරන පිඹුර අනුව පර්චස් හතයි දශම හයයි හයක් (අ:0 රූ:0 පෘ:7.66) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමඟ ය.

ඉහත කී අංක 5080/9000 දරන පිඹුර ප්‍රකාර එකී කැබලි අංක A2A දරන බිම් කොටස වනාහි මෙහි පහත විස්තර කරන පරිදි බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1757 සහ 1985.02.09 දින දරන පිඹුර ප්‍රකාර, (පාර පුළුල් කිරීමට පසුව) බෙදා වෙන්කළ කැබලි අංක A2 දරන බිම් කොටසේ නැවත මැන බෙදීමක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමාව තුළ, බොරැල්ලේ පිහිටි, වර්තමානයේ ආචාර්ය එන්.එම්.පෙරේරා මාවතේ වරිපනම් අංක 60A දරන, කලින් කොටා පාරේ (ආචාර්ය එන්. එම්. පෙරේරා මාවතේ) වරිපනම් අංක 60 (කොටසක්) දරන, බලයලත් මිනින්දෝරු එස්.වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1757 සහ 1985.02.09 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කළ කැබලි අංක A2 දරන බිම් කොටසට මායිම්, උතුරට : කොටා පාර ද; නැගෙනහිරට : කොටා පාරේ වරිපනම් අංක 62 ද; දකුණට :කොටා පාරේ වරිපනම් අංක 60/1 ද; බස්නාහිරට : එකී අංක 1757 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක A1 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1757 දරන පිඹුර අනුව පර්චස් නවයයි දශම දෙකයි පහක් (අ:0 රූ:0 ප:9.25) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි සැම සියලු දේත් සමඟ ය. මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ729/164 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

12- 1150

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ටෙලි - ෆික්ස් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.11.28 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් එම්.ඒ.රෝමනි තලවත්ත විසින් සහතික කරන ලද අංක 49 සහ 2012.04.05 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ හා පරිශ්‍රය බන්ධනදයි/උකස්කරු වශයෙන් ක්‍රියාකරමින් එකී ටෙලිෆික්ස් ටෙක්නෝලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී ටෙලි - ෆික්ස් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් එකී යූනියන් පෙදෙස්, අංක 02 යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් උකස්කොට, ඇපයට තබා ඇති බැවින් ද, එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී පහසුකම් මත අයවිය යුතු ගෙවීම් එකී ණයගැණුම්කරු විසින් පැහැර හැරීමකර ඇති බැවින් ද,

ඒ අනුව රුපියල් විසිඅටලක්ෂ අනූදහස් නවසිය අසූනවයකුත් ශත හතරක (රු.2,890,989.04) මුදල සහ 2016. 10.26 වැනි දිනට වාර ණය පහසුකම් මත හිඟ මුල් මුදල වන රුපියල් විසිහයලක්ෂ දොළොස්දහස් හාරසිය විසිඑකකුත් ශත අසූනවයක (රු.2,612,421.89) මුදල මත 2016.10.27 වැනි දින සිට තවදුරටත් පොළිය ද, තව ද, සම්බන්ධිත ගාස්තු, ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩු කොට, අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව තුළ, නුවර දෙඩන්වල ගමේ පිහිටි වරිපනම් අංක 11/2E දරන ගල්කන්ද එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්.එම්. අබේරත්න විසින් මැන සාදන ලද අංක 1369 සහ 1996.10.10 වැනි දින දරන පිඹුර ප්‍රකාර, බෙදා වෙන් කළ කැබලි අංක A දරන බිම් කොටසට මායිම්, උතුරට සහ ඊසානටඃ අංක 1447 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 12 සහ 13 (එම ඉඩමේම ඉතිරි කොටස) සහ පටුමඟද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ටී.ටී.ඩේවිඩ් විසින් මැන සාදන ලද අංක 1447 සහ 1939.08.28 දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1A සහ 2A ද, දකුණට සහ ගිනිකොණට : අංක 1369 පිඹුරේ කැබලි අංක B . C සහ D (අඩි 10ක් පළල පාර) සහ දෙඩන්වල පටුමග ද, බස්නාහිරට : පටුමගද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1369 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් විස්සක් (අ:0 රූ:1 ප:20) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, පස, ගහකොළ පළතුරු ආදී සැම සියලු දේත් සමග ය. මෙම දේපළ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 442/140 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, මෙහි පහත විස්තර කරන ඉඩමෙන් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමඟය.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව තුළ, නුවර දෙඩන්වල ගමේ පිහිටි ගල්කන්ද එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්.එම්. අබේරත්න විසින් මැන සාදන ලද අංක 1369 සහ 1996.10.10 වැනි දින දරන පිඹුර ප්‍රකාර, බෙදා වෙන් කළ කැබලි අංක D දරන බිම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක ඒ ද ඊසානට සහ නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ජේ. ඩී. ඩේවිඩ් විසින් මැන සාදන ලද අංක 1447 සහ 1939.08.28

දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක A සහ 2A යන ඉඩම්වල ඉතිරි කොටස සහ ගල් පර්වතය ද, දකුණට: අනිවත්ත සිට අස්ගිරිය දක්වා වැටී ඇති ගල්කන්ද පාර ද, බස්නාහිරට : කැබලි අංක C ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1369 දරන පිඹුර අනුව පර්චස් පහයි දශම දෙකක් (අ:0 රූ:0ප:5.2) විශාල බිම් කැබැල්ලය. මෙම දේපළ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 442/141 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.
12- 1151

---

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.11.02 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. ලෝරන්ස් මහත්මිය විසින් සහතික කරන ලද 2014.10.13 දිනැති අංක 6532 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සින්තුජා ශ්‍රී ගනේෂරත්නම් යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී අංක 6532 උකස්කරය යටතේ රුපියල් පනස් එක් ලක්ෂ තිස් නව දහස් දෙසිය අනූ හතයි ශත තුන (රු. 5,139,297.03) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද 2016.07.27 වැනි දින සිට වර්ෂයකට 14% බැගින් රුපියල් පනස් එක් ලක්ෂ තිස් නව දහස් දෙසිය අනූ හතයි ශත තුන (රු. 5,139,297.03) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් පනස් එක් ලක්ෂ තිස් නම දහස් දෙසිය අනූ හතයි ශත තුන (රු. 5,139,297.03) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයත් වෙන්දේසිකාර ෂොක්මන් හා සමරවික්‍රම විසින් එකී අංක 6532 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

(1) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 148 දරන අමන්දෙළුව ග්‍රාම නිලධාරී වසමේ සීදූව කටුනායක නගර සභා සීමාව තුළ අමන්දොළුව ග්‍රාමයේ පිහිටි අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. කේ. සමරසිංහ මහතා විසින් 2008.03.13 වැනි දින මැන සාදන ලද අංක 161 දරන පිඹුරේ ලොට් අංක 01ට මායිම්, උතුරට : වැත්තැව පාර ද, නැගෙනහිරට : ලොට් අංක 2 ද, දකුණට : එකමුතු මාවත ද, බස්නාහිරට : වැත්තැව පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20)ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේත් සමගින් වේ.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන්කර ඇති කොටස්වල මාර්ග අයිතියද සමග වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් කාර්යාලයේ H 50/42 යටතේ ලියාපදංචි වී ඇත.

(2) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 148 දරන අමන්දෙළුව ග්‍රාම නිලධාරී වසමේ කටුනායක සීදූව නගර සභා සීමාව තුළ අමන්දොළුව ග්‍රාමයේ පිහිටි අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. කේ. සමරසිංහ මහතා විසින් 2008.03.13 වැනි දින මැන සාදන ලද අංක 161 දරන පිඹුරේ ලොට් අංක 02 ට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : ලොට් අංක 3 ද, දකුණට : එකමුතු මාවත ද, බස්නාහිරට : ලොට් අංක 01 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේත් සමගින් වේ.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන්කර ඇති කොටස්වල මාර්ගය අයිතිය ද සමග වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් කාර්යාලයේ H 50/43 යටතේ ලියාපදචි වී ඇත.

(3) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 148 දරන අමන්දෙළුව ග්‍රාම නිලධාරී වසමේ කටුනායක සීදූව නගර සභා සීමාව තුළ අමන්දොළුව ග්‍රාමයේ පිහිටි අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. කේ. සමරසිංහ මහතා විසින් 2008.03.13 වැනි දින මැන සාදන ලද අංක 161 දරන පිඹුරේ ලොට් අංක 03 ට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : ලොට් අංක 4 ද, දකුණට : එකමුතු මාවත ද, බස්නාහිරට : ලොට් අංක 02 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේත් සමගින් වේ.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන්කර ඇති කොටස්වල මාර්ගය අයිතිය ද සමග වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් කාර්යාලයේ H 50/44 යටතේ ලියාපදචි වී ඇත.

(3) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 148 දරන අමන්දෙළුව ග්‍රාම නිලධාරි වසමේ කටුනායක සීදුව නගර සභා සීමාව තුළ අමන්දෝළුව ග්‍රාමයේ පිහිටි අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. කේ. සමරසිංහ මහතා විසින් 2008.03.13 වැනි දින මැන සාදන ලද අංක 161 දරන පිඹුරේ ලොට් අංක 04 ට මැයිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : එන්. අජිත් සිල්වා මහතාට අයත් ඉඩම ද, දකුණට : එකමුතු මාවත ද, බස්නාහිරට : ලොට් අංක 03 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසි හතරයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 20.75) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේත් සමගින් වේ.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන්කර ඇති කොටස්වල මාර්ගය අයිතිය ද සමග වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් කාර්යාලයේ H 50/45 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

12 - 1212

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන ශාඛාව**

ගණුදෙනුකරුගේ නම : ජනතා වතු සංවර්ධන මණ්ඩලය, අංක 55/75, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

වර්ෂ 2016ක් වූ නොවැම්බර් මස 30 වැනි දින පවත්වන ලද පෑන් ඒෂිය බෑන්කිං කෝපරේෂන් පීඑල්සීහි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් 1999.06.24 වැනි දින ලියා සහතික කරන ලද අංක 737 සහ 2001.11.07 වැනි දින ලියා සහතික කරන ලද අංක 1093 දරන බැඳුම්කරයේ සඳහන් නිශ්චල දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012.02.29 වැනි දින යෝජනා සම්මුතිය ප්‍රකාර බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත පවරනු ලැබූ බලය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට ද, එකී 1999.06.24 වැනි දින ලියා සහතික කරන ලද අංක 737 සහ 2001.11.07 ලියා සහතික කරන ලද අංක 1093 දරන බැඳුම්කර යටතේ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය ලවා වෙන්දේසියේ විකිණීමට බලය පැවරීමට ද, එකී 2012.02.09 වැනි දින දරන සම්මුතිය මෙම නව යෝජනා සම්මුතියේ සඳහන් වන තාක් දුරට සංශෝධනය කිරීමටත් ය.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
කළමනාකාරි - ණය අයකරගැනීමේ අංශය.

12 - 1242

---

**ලංකා බැංකුව**

**ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ වැරැල්ලගම, ෆෙරිහිල් එස්ටේට්, අංක 24හි සමරකෝන් මුදියන්සේලාගේ රුවන් සද්දමංගල සමරකෝන් යන අයගෙන් අයවිය යුතු මුදල පිළිබඳ දැන්වීම සඳහා වන සංශෝධිත දැන්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1942 දරන *ගැසට් පත්‍රයේ* 2015.11.20 වැනි දින පළකරන ලද ඉහත වෙන්දේසිය පිළිබඳ (21) දැන්වීමේ කරුණු පහත සඳහන් අයුරු නිවැරදි විය යුතු බව දන්වා සිටිමු.

1. පළමු ඡේදයේ දහවන පේළියේ "වේරෙල්ලේගම" යන්න වැරැල්ලගම" ලෙස නිවැරදි විය යුතුයි.

2. පළමු (1), උපලේඛනයේ හයවන පේළියේ සඳහන් අංක "2596 දරන පිඹුර" වෙනුවට 2596 A දරන පිඹුර" ලෙස නිවැරදි විය යුතුයි.

3. දෙවන (2) උපලේඛනයේ හයවන පේළියේ "2556 A දරන පිඹුර" වෙනුවට "2596 A දරන පිඹුර" ලෙස නිවැරදි විය යුතුයි.

ඩී. එම්. එන්. ජයතිලක,
කළමනාකරු.

ලංකා බැංකුව,
කටුගස්තොට.

12 - 1278/1

---

**ලංකා බැංකුව**

**වෙන්දේසියේ විකිණීම පිළිබඳ ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම සඳහා වන සංශෝධිත දැන්වීම**

වෙරෙල්ලේගම, ෆෙරිහිල් එස්ටේට්, අංක 24හි සමරකෝන් මුදියන්සේලාගේ රුවන් සද්දමංගල සමරකෝන් මහතා විසින් උකස් කරන ලද දේපළ විකිණීම.

ණය යොමු අංකය : 237/13.

**ලංකා බැංකුව - කටුගස්තොට**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1995 දරන *ගැසට් පත්‍රයේ* 2016.11.25 වැනි දින පළකරන ලද ඉහත වෙන්දේසිය පිළිබඳ (22) දැන්වීමේ කරුණු පහත සඳහන් අයුරු නිවැරදි විය යුතු බව දන්වා සිටිමු.

1. පළමු ඡේදයේ පළමු පේළියේ "වේරෙල්ලේගම" යන්න " වැරැල්ලගම" ලෙස නිවැරදි විය යුතුයි.

2. පළමු (1), උපලේඛනයේ හත්වන පේළියේ සඳහන් "අංක 2596 දරන පිඹුර" වෙනුවට "2596 A පිඹුර" ලෙස නිවැරදි විය යුතුයි.

3. දෙවන (2) උපලේඛනයේ හත්වන පේළියේ "2556" A දරන පිඹුර" *වෙනුවට* "2596 A පිඹුර" ලෙස නිවැරදි විය යුතුයි.

ඩී. එම්. එන්. ජයතිලක,
කළමනාකරු.

ලංකා බැංකුව,
කටුගස්තොට.

12 - 1278/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.